පැවත එන ධර්මතා අතරින් කරුණු දහයක් ඇත. උඩු රැවුල කොට කිරීම, යටි රැවුල වැවෙන්නට හැරීම, දත් මැදීම, නාසයට ජලය යවා පිරිසිදු කිරීම, නියපොතු කැපීම, දහඩිය රැඳෙන ස්ථාන සෝදා හැරීම, කිහිලි රෝම ඉවත් කිරීම, ලිංගෙන්ද්රීය රෝම බෑම, මළ මූත්රා කළ පසු ජලයෙන් පිරිසිදු කිරීම.

ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත්
හදීසයකි. “පැවත එන ධර්මතා අතරින් කරුණු දහයක් ඇත. උඩු රැවුල කොට කිරීම, යටි රැවුල වැවෙන්නට හැරීම, දත් මැදීම, නාසයට ජලය යවා පිරිසිදු කිරීම, නියපොතු කැපීම, දහඩිය රැඳෙන ස්ථාන සෝදා හැරීම, කිහිලි රෝම ඉවත් කිරීම, ලිංගෙන්ද්රීය රෝම බෑම, මළ
මූත්රා කළ පසු ජලයෙන් පිරිසිදු කිරීම.” වාර්තාකරු මෙසේ පවසයි. ‘දහවැනි කරුණ මට අමතක විය. නමුත් එය මුඛය කලත්වා පිරිසිදු කිරීම විය හැක.” එය වාර්තා කළ වාර්තාකරුවන්ගෙන් කෙනෙකු වන ‘වකී’ තුමා මෙසේ පවසයි: ජලයෙන් පිරිසිදු කිරීම: එනම් මළ මූත්රා කළ පසු
ජලයෙන් පිරිසිදු කිරීමයි. [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉමාම් මුස්ලිම් එය වාර්තා කර ඇත]

පෙර සිට පැවත එන පිළිවෙත්වල එකතුව ගැන නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා ප්රකාශ කළ බව ආඉෂා (රළියල්ලාහු අන්හා) තුමිය විසින් මෙසේ දන්වා සිටියාය. පෙර සිට පැවත එන ධර්මතා යනු අල්ලාහ් කවර කරුණක් මත තම ගැත්තන් මවා ඇත්තේ ද එම මැවීම්හි ධර්මතාවයි. ඔවුන් ඒවා පුරුද්දක් ලෙස පිළිපැදිය යුත්තන් බවට පත් කළේය. සැබැවින්ම ඒවා යහපත් කටයුතු අතරිනි. මෙමගින් අදහන් කරනුයේ ආරෝග්යමත් ධර්මතාවය. ඊට හේතුව විකෘති වූ ධර්මතාවන්ට නොසලකා හරිනු ලැබෙන බැවිණි. නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම් තුමාගේ ප්රකාශය මෙසේය. “සෑම දරුවකුම පොදු ධර්මතාවන් මත ඉපදෙන්නේය. ඔහුව යුදෙව් බවට පත් කරන්නේත් කිතුනුවන් බවට පත් කරන්නේත් අග්නි වන්දනා කරුවන් බවට පත් කරන්නේත් ඔහුගේ දෙමව්පියන්ය.” ඒවා අතරින් පළමුවැන්න: “උඩු රැවුල කොට කිරීම” එනම් තොල මතුවන තරමට එය කපා හැරීමය. එසේ කපා හැරීමේදී පිරිසිදු භාවයක් පවතිනු ඇත. එමෙන්ම නාසයෙන් පිටවන දැයින් ප්රවේසම් විය හැක. සැබැවින්ම උඩු රැවුල තොලට පහළින් එල්ලෙමින් පවතින විට, ඒ ගැන නොළකා හරින්නන් යහපත් ලෙස කටයුතු කරන්නට බැලුව ද එම ස්ථානයේ විශාල වශයෙන් විකෘතිභාවයක් දිස්වන අතර ඔහු ගන්නා ආහාර පාන ද එහි තැවරෙන්නට බලයි. එබැවින් උඩු රැවුල බාමින් හෝ කැපීමෙන් හෝ එය පිළිවෙලට සකස් කර ගත යුතුය. දින හතළිහකට වඩා වැඩියෙන් එය අතහැර නොදැමිය යුතුය. අනස් (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලද හදීසයක් මුස්ලිම් තුමා මෙසේ දන්වා ඇත. “උඩු රැවුල කොට කිරීම, නියපොතු කැපීම, කිහිලි රෝම ඉවත් කිරීම, ලිංගෙන්ද්රීය රෝම ඉවත් බෑම යනාදිය දින හතළිහකට වඩා වැඩි කාලයක් අප අත් නොහරින මෙන් පවසා අපට ඒ සඳහා කාලය නියම කළේය. “යටි රැවුල වැවෙන්නට හැරීම” යටි රැවුල යනු නිකටෙහි හා කම්මුලෙහි වැවෙන දෑය. එය වැවෙන්නට හැරීම යනු එය බෑමෙන්, සුළු හෝ වැඩි වශයෙන් කොට කිරීමෙන් එයට හානියක් නොකර සම්පූර්ණයෙන්ම අතහැර දැමීමයි. වැවෙන්නට හැරිම යනු අධිකත්වය හා පූර්ණත්වය යන අදහසින් ද ගනු ලැබේ. ඒ අනුව අධික ලෙස වැවෙන්නට ඉඩ හරින්න. බහුල ලෙස වැවෙන්නට ඉඩ හරින්න යන්නයි. උත්තරීතර අල්ලාහ් ‘අෆා’ යන පදය මෙසේ ප්රකාශ කර ඇත: ‘දෙදෙනාම අතහැර දමන තෙක්’.

පිරිසිදු කිරීම විය හැක.” මෙය වාර්තා කරු තුළ පැවති සැකයයි. මින් ලැබෙන පාඩම වනුයේ සැබැවින්ම මෙම කරුණු සියල්ලම මිනිසාගේ පෙනුම පූර්ණවත් කරයි. ඔහුව පිරිසිදු කරයි. හිංසා සහගත හා පිළිකුල් සහගත දෑ ඔහුගෙන් ඉවත් කරයි.

http://www.sunnah.global/hadeeth/si/show/3730